# 2018 පෙබරවාරි මස සාංඝික පවුල් දින සුපුවත

01. ආරම්භක ගීය - පුබුදු ගී අංක 381 (නව මුද්‍රණය) 356 (පැරණි මුද්‍රණය)
"වඩිනු මැනවි මැවුම්කරු වූ සුදතුනි..."

ප්‍රශංසාවට යොමුව :

* අපි පසුගිය මාසයේ සමිඳාණන් වහන්සේ ගේ ස්නාපන මංගල මහෝත්සවයට සහභාගි වූයෙමු.

* එහිදී ඔවුන් වහන්සේ ශුද්ධාත්ම ස්නාපනයත් සමඟ ලැබූ මහිමාන්විත පුත්‍රභාවයේ අත්දැකීම පිළිබඳවත්, ඔවුන්වහන්සේට උරුමවූ දූතික සේවාව පිළිබඳවත් අවදි වූවෙමු.

* එදින මුළු මහ පුබුදුවම අළුත් යුගයක් කරා රැගෙන යන ලෙස යාච්ඤා කළෙමු.

* ඔබත් මමත් ලබා ඇති ප්‍රසාද ස්නාපනය නමැති ප්‍රසාද නිධානය තුළින් ඔවුන්වහන්සේ ගේ අභිමානවත් පුත්‍රභාවයටත්, ඒ සමඟම ඔවුන්වහන්සේ ගේ සේවක පුත්‍ර භාවයටත් අවදි වෙමින්, අද දවසේ ආරම්භක ප්‍රශංසාවට පිවිසෙමු.

ගීය : "ඔබෙන් තොරවූ මහ පොළව පවා...." (පුබුදු ගී අංක 150)

02. ආපසු බැලීම :

* පසුගිය මස අපි සමිඳාණන් වහන්සේගේ ස්නාපන මංගල මහෝත්සවයට සහභාග වූයෙමු.
* ඒ අනුව සමිඳාණන් වහන්සේ ජොර්දාන් නදියේ බව්තිස්ම ස්නාපනය ලැබූ අත්දැකීම භාවනා කරද්දී ජලයෙන් බව්තිස්ම ස්නාපනය වගේම, ශුද්ධාත්මයාණන්ගෙන් අප ලබන්නාවූ ස්නාපනය යන දෙකම ක්‍රිස්තියානි කතෝලික ජීවිතයට වැදගත් බව අපි දැනගත්තෙමු.
* ඒ සමඟම අප එදින
  1. මනස්ස්ථාපනයේ අත්දැකීමට ඇතුළුවීමු.
  2. ශුද්ධාත්ම ස්නාපනයට ඇතුළුවීමු.
  3. දූතසේවාව (ප්‍රෙසේවාස් මෙහෙවර) එලදරණු සඳහා ආලේපය ලැබුවෙමු.
* <u>අත්දැකීම් බෙදා ගැනීම :</u> එදින ඔබ ලැබූ ඔබගේ අත්දැකීම කුඩා සංඝ තුළ සාංගික කර ගන්න. පසුව අත්දැකීම් කිහිපයක් පොදුවේ සාංඝික කර ගන්න. එය මුල් කරගෙන සුළු මොහොතක් ප්‍රශංසා කරමු.

03. දවසේ සුපුවත

(අ) 2017 ශුද්ධාත්ම මංගල මහෝත්සවයේ තේමා දේශනයේදී අපට ප්‍රධාන වචන කීපයක් ලැබුණි. 2017 සිට වසර හතරක් මනස්ස්ථාපනයේ කාලයක් බවට කිතු දන පුබුදුව තුළ ප්‍රකාශයට පත් කිරීම ඉන් ප්‍රධාන තැනක් ගනී. මනස්ස්ථාපනය නමැති වචනය කෙරෙහි ගැඹුරු අවදිවීමකට 2018 චතාරික සමය වරප්‍රසාදජනක සමයක් කර ගැනීමට අපි ඔබට ඇරයුම් කරමු. 2021 වසරේ කිතු දන පුබුදුව කෙරෙහි උදාවන ජුබිලි වසරේදී කිතු දන පුබුදුව දෙව් මහෝත්තමයාණන්ට අලංකාර තෑග්ගක් කොට පුද දෙන්නට මෙයටත් වඩා සූදානමක් තිබිය හැකිද?

(ආ) ශු.මාක් 1:12-15, ශු.මතෙව් 4:1-2 පොදුවේ ප්‍රකාශ කරන්න.
"සමිඳාණන් ගැන අනාවරණය ...." (පුබුදු ගී අංක 306)

* සුළු මොහොතක් ඉහත ශුද්ධවූ ලියවිලි පාඨ සමඟ ක්‍රිස්තුන් වහන්සේ දෙස බලන්න. ළඟ සිටින අය සමඟ ක්‍රිස්තුන් වහන්සේගේ අභ්‍යන්තරය බෙදා ගන්න.

ශුද්ධවර මාක් තුමාගේ සුවිශේෂයේ පළමුවන පරිච්ඡේදයේ දොළොස්වන පදයේ සිට පහළොස්වන පදය දක්වා කොටසට අනුව ජේසු ක්‍රිස්තුන් වහන්සේ දෙස බලද්දී අපට පෙනෙනුයේ ඔවුන් වහන්සේ දින සතළිසක් යක්ෂයා විසින් පරීක්ෂා කරනු ලබමින් පාළුකරයේ විසූ බවයි. ශුද්ධවර මතෙව් තුමාගේ සුභාරංචියට අනුව එම දින සතළිසම සමිඳාණන් ගත

කලේ නිරාහාර ශීලයෙන් යුතුවය. එම දින සතළිහ ජේසු සමිඳාණන්ගේ ජීවිතයේ ගැඹුරු ඥානකාන්ති සමයක් ලෙස අපට පෙන්වා දිය හැකිය. මේ ඥානකාන්ති සමය ගත කලේ පාළුකරයෙහි බඩගින්නේ, පිපාසිතව හා යක්ෂයාගේ පරීක්ෂා පරාජය කරමිනි. "මනස්ස්ථාපනය වන්න ; දෙවියන් වහන්සේගේ රාජ්‍යය ආසන්නය" යනුවෙන් ඔවුන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් නික්මුණේ පාළුකරයෙන් පිටතට විත් කළ පළමු දේශනයෙහි බව මාක් තුමා තවදුරටත් අපට වාර්තා කරයි. ජේසුස් වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතයේ පළමු දේශනයේ ප්‍රධාන තැනක් ගන්නාවූ වචන දෙකකි මනස්ස්ථාපනය හා දෙවියන් වහන්සේගේ රාජ්‍යය. එසේ නම් ජේසුස් වහන්සේගේ අභ්‍යන්තරය අපට සුපැහැදිලිය. දෙවියන් වහන්සේගේ රාජ්‍යය දකින්නට නම් මනස්ස්ථාපනය විය යුතුමය. දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වීමේ දොරටුවේ යතුර මනස්ස්ථාපනයයි. මේ යුගයේ පුබුදු ජනතාවට දෙවිඳුන්ගෙන් ලැබෙන යුගයේ වචනය "මනස්ස්ථාපනයේ යතුර ඔබගේ දකුණු අතින් ගිලිහෙන්නට ඉඩ නොදෙන්න" කියාය.
මනස්ස්ථාපනය පිළිබඳ කථා කරන විට අප අවදියෙන් සිටිය යුතු පරීක්ෂාවක් තිබේ. මගේ පාපය දෙස, මා දෙස නොව, අන් අය දෙස බැලීමට හා අන් අයව විනිශ්චය කිරීමට තිබෙන පරීක්ෂාවයි. අප එම උගුලට අසු නොවිය යුතුය. මේ වසර හතරම තමා පිළිබඳ ගැඹුරු බැල්මක් හෙළීමට, මට මාව හඳුනා ගැනීමට මා පිළිබඳ ස්වයං අවබෝධයකට අවස්ථාව උදා කරගත යුතුය. අධ්‍යාත්මික ගමනක යෙදෙන අප සියළු දෙනාටම තමා ගැන අවබෝධයක් තිබිය යුතුය. ආධ්‍යාත්මික පරිණතභාවයක් කරා ගමන් කළ හැකිවන්නේ තමාව තමා අවබෝධ කරගෙන, තමා තමාට අවදිවන ප්‍රමාණයටය. සාංඝික ජීවිතයක් ගත කරන අප හට සාංඝික සම්බන්ධකම් වර්ධනය කර ගැනීමට තමාව හඳුනා ගෙන සිටීම උදව්වකි. එලෙසම තමාව අවබෝධ කර ගන්නට උවමනාවක් නැති කෙනෙක් අනිත් අයට තමාගේ ජීවිතයට අත තියන්නට ඉඩ දීමට රිසි නොවෙයි. ආධ්‍යාත්මික ජීවිතයේ පූර්ණත්වයක් පතන සියළු දෙනාම ස්වයං අවබෝධයක් ඇතිකර ගැනීමට තමාම තමා පිළිබඳ වගකීමක් ගතයුතු වෙයි.
අපව පවිත්‍ර කළහැකි එකම තැනැන් වහන්සේ දෙවියන් වහන්සේය; ඔවුන් වහන්සේගේ කොන්දේසි රහිත ප්‍රේමය ය. ක්‍රිස්තුන් වහන්සේ කරණකොට ගෙන අප වෙත ගලා ගෙන එන ඔවුන් වහන්සේගේ සමාවදීමේ ප්‍රේමය ය. එසේ නම් අපි ශුද්ධවූ දෙවියන් වහන්සේට ළං වන්නට වන්නට ඔවුන් වහන්සේගේ ශුද්ධවූ කැමැත්ත අප මනස්ථානය වීමයි. අප දෙවියන් වහන්සේගේ මේ ශුද්ධවූ කැමැත්තට 'ආමෙන් ' කියද්දී ඔවුන් වහන්සේ ඔබව, මාව, මුළු පුබුදුවම පවිත්‍ර කරාවි. මේ යුගයේ ශුද්ධවූ දෙවියන් වහන්සේ පුබුදුවෙන් ඉල්ලා සිටින්නේ 'ඔබ මාගේ රාජ්‍යයේ සාක්ෂිකරුවෙකු වීමට නම් ඔබව පවිත්‍ර කිරීමට මට ඉඩ දෙන්න' කියාය. මනස්ස්ථාපනය මා තුළ ඇතිවීමට නම් මා ශුද්ධාත්මයාණන් වහන්සේට ඉඩ දිය යුතුවෙයි. මනස්ස්ථාපනය - සිත හැරීම - මනස හැරීම සත්‍ය වශයෙන්ම මා සිටින තැන කුමක්දැයි මට පෙන්වා දී එතැනින් හැරෙන්නට මා යොමු කළ හැක්කේ ශුද්ධාත්මයාණන් වහන්සේට පමණකි. අපගෙන් කිසිවෙක් හෝ මනස්ස්ථාපනය නොවී, නොහැරී පරණතාවය තුළම දිවි ගෙවනවා නම් එහි අර්ථය "මගේ මනස්ස්ථාපනයට මම ශුද්ධාත්මයාණන් වහන්සේව සම්බන්ධ කරගෙන නැහැ" යන්නයි. මනස්ස්ථානයට ශුද්ධාත්මයාණන් වහන්සේව සම්බන්ධ කරගත යුතුයි. ශුද්ධාත්මයාණන් වහන්සේ පැමිණි කල පරණතාවය දවා නැවුම් භාවය පුරවාලනු ඇත. පරණ දේ පහව ගොස් සියල්ල අළුත්වීම ඇරඹෙනු ඇත. මුලින්ම අළුත් මැවිල්ල ඇතිවිය යුත්තේ මා තුළයි. ඊළඟට අපගේ පවුල අළුත් වෙයි. සංඝය අළුත් වෙයි. මුළු පුබුදුවම අළුත් මැවිල්ලක් වෙයි. ශුද්ධාත්මයාණන් වහන්සේට ඉඩ දෙන්නෝ ශුද්ධාත්මයාණන් වහන්සේගේ මෙහෙයවීමට නතුවන්නෝය.

ශුද්ධාත්මයාණන් වහන්සේ අළුත් මැවිල්ලක් වීමේ මනස්ස්ථාපනය වෙත යොමු කරමින් අපව කුරුස පාමුලට ගෙන යයි. එහිදී ජේසු සමිඳුන්ගේ ශ්‍රී රුධිරය පාපයේ කිළිටෙන් පවිත්‍රතාවය ලබා දෙයි. කුරුසියේ පාමුලට යෑම සුවිශේෂී අත්දැකීමකි. ශ්‍රී රුධිරය පවිත්‍රතාවය පමණක් නොව, ශ්‍රී රුධිරයේ ආලේපය කරණකොට අපට සුවයද ජීවනයද ලබා දෙයි. එලෙසම අපගේ පෙළඹීම්, මුල් අගුණ පව්, ඇතුලාන්ත තුවාලයන්, මතකයන්, රිද්දීම්, වහල්කම් හා විෂම පුරුදු, ඇබ්බැහිවීම්වලට පහර වැදෙන තැනකි. මෙහිදී ශුද්ධාත්මයාණන් වහන්සේ අපගේ මේ බැඳීම්වලට අපව අවදි කරනවා පමණක් නොව ක්‍රිස්තුන් වහන්සේගේ රුධිරයේ බලයෙන් ඒවා මුලිනුපුටා දමන සේක.

මෙම චතාරික සමයේ දිනපතා අවදිවන සෑම උදෑසනකම, "මගේ අතේ මනස්ස්ථාපනයේ යතුර තිබෙනවා ද කියා" අවදිවන්න මනස්ස්ථාපනයේ යතුරයි මා හට දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වීමේ දොරටුව හැර දෙන්නේ. එය මාගේ දකුණතින් ගිලිහිලා නම්, අප ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් මනස්ස්ථපනයේ තෑග්ග ඉල්ලා සිටිමු. මේ චතාරික සමය අපට තෑග්ගක් කර දෙන්නැයි යාච්ඤා කරමු.

(ඇ) සාකච්චාව :

i චතාරික සමය මනස්ස්ථාපනයෙන් යුතුව ගත කිරීමට ගතහැකි පියවරවල් සාකච්ඡා කරන්න. (පෞද්ගලිකව, පවුලක් ලෙස, සංඝයක් ලෙස)

ii චතාරික භාවනාව ශ්‍රාවක සංඝය තුළ ක්‍රියාත්මක කරන අයුරු සාකච්ඡා කරන්න. ප්‍රශංසා ගම්, කුඩා සංඝ ලෙස සංවිධානය වීම සුදුසුය.
පුබුදු ගී අංක 291 "හැරෙන්න සුපුරුදු ගමන නවත්වා....."

* පහත කරුණු දෙක දිවා ආහාරයෙන් පසුව බෙදා ගැනීමට යොමු කරන්න.

iii මේ කාලය තුළ අප්‍රියෙල් 01 වනදා (පාස්කු ඉරිදා) දක්වා අප ආරම්භ කර ඇති 'දම්වැල් යාච්ඤාව ' පිළිබඳ අත්දැකීම් සාංඝික කර ගන්න.

iv ශුද්ධවර ප්‍රුසේවාස් මෙහෙවරට ඔබගේ දායකත්වය කෙලෙසදැයි බෙදා ගන්න.

- ඔබට දුර බැහැර යාමට නොහැකි කෙනෙක් නම් එයට යාච්ඤාවෙන් දායක විය හැකි ආකාරය පිළිබඳව බෙදා ගන්න. ස්ථිරව ඒ සඳහා තීරණ ගන්න.
- සංඝයෙන් බැහැරව අනාගාරික දූත සේවාවේ යෙදෙන්නට ඔබට හැකිනම් ඒ සඳහා තීන්දු තීරණ ගන්නට, අපට ගතහැකි පියවර පිළිබඳව සාකච්ඡා කරන්න.
- කවදාද පටන් ගන්නේ? කොහාටද යන්නේ? කා සමඟද යන්නේ? සාකච්ඡා කරන්න.
- ප්‍රශංසා ගමක්, ශ්‍රාවක සංඝයක් හැටියට ගතහැකි පියවර පිළිබඳ සාකච්ඡා කර තීරණ ගන්න.

04. අවසාන යාච්ඤාව :
පුබුදු ගී අංක 113 "බාධක පීඩා ......"

**************************